DOI: https://doi.org/10.4038/jdrra.v2i2.40

The Journal of Desk Research Review and Analysis, Vol. 2, Issue 2, 2024, 27-39

TRADITIONAL FOLK CONSCIOUSNESS REFLECTED IN SINHALA *THERAVILI*

HAAS Ihalagama

Abstract

Theravili literature is a prominent genre of folklore that has been created and practiced by the Sinhalese people for centuries. Like other forms of folklore, the creation of Theravili is based on the folk-life of the traditional Sinhalese and the folk consciousness that is central to the emotions, feelings, experiences and concepts that they have absorbed from the environment. Language, signs, and symbols unique to each society serve as vital communication tools in generating, practicing, and transmitting folklore genres, including Theravili. This research explores the various forms and creative features of Theravili, such as riddles, word reversals, and wordplay, which serve as unique communication tools within the Sinhala language. The study addresses whether it is possible to uncover different aspects of the traditional Sinhalese folk consciousness through the analysis of Theravili literature. To gather information for this research, secondary sources were utilized following a qualitative research method. Quotations have been included without editing the writing style or linguistic errors of the original authors.

Keywords: Tun Teravili, Prahelika, Jana Vigngnanya, Pada Perali,Geta

[1]Professor, Department of Sinhala, University of Kelaniya, Sri Lanka

Email: swarnai@kln.ac.lk http://orcid.org/0009-0007-8924-742X

The Journal of Desk Research Review and Analysis © 2024 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 18.09.2024
Accepted date: 22.10.2024

සිංහල තේරවිලිවලින් පිළිබිඹු වන සාම්ප්‍රදායික ජන විඥ්ඤාණය

එච්.ඒ.ඒ.එස්. ඉහළගම

සාරසංක්ෂේපය

අනාදිමත් කාලයක පටන් සිංහල ජනතාව ඇසුරේ නිර්මාණය වී ව්‍යවහාරයට පැමිණ තිබෙන ප්‍රකට ජනශ්‍රැති ශානරයක් වශයෙන් තේරවිලි සාහිත්‍යය හැඳින්විය හැකි ය. සෙසු ජනශ්‍රැති විශේෂවලට මෙන් ම තේරවිලි නිර්මාණය වීමට ද පාදක වී තිබෙන්නේ සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජන ජීවනය හා ඔවුන් විසින් පරිසරය ඇසුරින් උකහා ගැනුණු හැඟීම්, දැනීම්, අත්දැකීම් හා සංකල්ප කේන්ද්‍රීය වූ ජන විඥ්ඤාණය යි. ඕනෑ ම ජනශ්‍රැති ශානරයක් උත්පාදනය වීමටත් ව්‍යවහාරයට පත් වීමටත් පරම්පරාන්තර ව අඛණ්ඩ ව සම්ප්‍රේෂණය වීමටත් උපයෝගී වී ඇත්තේ ඒ ඒ ජන සමාජයට අනන්‍ය වූ භාෂාව, සංඥා ක්‍රම හා සංකේතාදිය ඇතුළත් වූ සන්නිවේදන මෙවලම් ය. ඒ අනුව, සුවිශේෂ සන්නිවේදන මෙවලමක් වශයෙන් ද නිරීක්ෂණය වන සිංහල තේරවිලිවල පවතින ප්‍රහේලිකා, පද පෙරළි සහ ගැට වැනි විවිධ ප්‍රභේදත් ඒවායෙහි නිර්මාණාත්මක ලක්ෂණත් විමර්ශනය කිරීමේ මූලික අරමුණු පෙරදැරි ව සිදු කෙරෙන මේ පර්යේෂණයේ ගැටලුව වන්නේ තේරවිලි සාහිත්‍යයෙන් සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජන විඥ්ඤාණයෙහි විවිධ පැතිකඩ අනාවරණය කර ගත හැකි ද? යන්න ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගත ව සිදු කෙරෙන මේ පර්යේෂණ පත්‍රිකාවට අවශ්‍ය තොරතුරු රැස් කෙරුණේ ද්විතීයික මූලාශ්‍රය භාවිතයෙනි. ඒ මූලාශ්‍රය ඇසුරින් අදාළ උත්පාඨන දක්වා ඇත්තේ ඒ ඒ ලේඛකයන්ගේ ලේඛන ශෛලිය හා භාෂාමය දෝෂ සංස්කරණයෙන් තොර ව ය.

ප්‍රමුඛ පද: *තුන් තේරවිලි, ප්‍රහේලිකා, ජන විඥ්ඤාණය, පද පෙරළි, ගැට*

හැඳින්වීම

විනෝදාස්වාදය සම්පාදනය කිරීම, (පුද්ගලයන්ගේ) බුද්ධිමත් භාවය පරීක්ෂා කිරීම, තොරතුරු සන්නිවේදනය කිරීම ඇතුළු විවිධවිෂයක අවශ්‍යතා මස්තකප්‍රාප්ත කර ගැනීමේ අරමුණින් සාම්ප්‍රදායික ගැමියන් විසින් අවස්ථෝචිත ව නිර්මාණය කර ගැනුණු තේරවිලි සිංහල ජන සාහිත්‍යයේ ප්‍රමුඛාංගයකි; ජනප්‍රිය ජනශ්‍රැති ප්‍රභේදයකි.

'ශ්‍රැතිය' හෙවත් ශ්‍රවණය මාධ්‍යය කොට ගෙන ජනයා ඇසුරේ පරම්පරාන්තර ව සම්ප්‍රේෂණය වීම ජනශ්‍රැතියේ ප්‍රධාන ලක්ෂණය යි. ''ඇසීම, ආරංචිය''(සෝරත හිමි, 1999, පි. 1000) යන අරුත් දෙන ශ්‍රැති යන යෙදුම සමග ''යම් ස්ථානයකට, විෂයයකට හෝ කණ්ඩායමකට සම්බන්ධ සාම්ප්‍රදායික දැනුම, විශ්වාස හා කථා''(The Britannica Dictionary, Retrieved 28.09.2024) ආදිය හැඳින්වීමට ඉංග්‍රීසි භාෂාවේ භාවිත lore යන යෙදුම සමගාමී භාවයක් පෙන්නුම් කරන ආකාරය 'ශ්‍රැතිය' යන යන්නට 'ජන' යන විශේෂණය බද්ධ වී සැකසුණු 'ජනශ්‍රැතිය' යන්නෙහි අන්තර්ගත සංරචක විශ්ලේෂණය කිරීමෙන් වටහා ගත හැකි ය. ජනශ්‍රැතිය හැඳින්වීම සඳහා ඉංග්‍රීසි භාෂාවේ භාවිත folklore යන වචනයෙහි අර්ථය වන ''සිතීමකින් තොරව සහ වාචිකව ආරක්ෂා කරගන්නා ලද සාම්ප්‍රදායික සිරිත් විරිත්, ලබ්ධි විශේෂ, නැටුම්, ගායනා, කතා හා කියමන්''(Webster's Third International Dictionary to the English Language, 1961, P. 882) යන්නෙන් හැඟෙන්නේ, වාචික ව හෙවත් කටවහර මුල් කරගෙන පැවතෙන සියලුම දෑ ජනශ්‍රැතියට අයත් වන බව ය; ''ජනශ්‍රැතිය යනු වාචිකව හෝ සිරිත් විරිත් මගින් සම්ප්‍රදායෙන් උරුම කරනු ලැබූ දෙයකි. එයට වාචිකව එන ජනකතා, ජන ගී, ආප්තෝපදේශ, තේරවිලි අයත් ය''(Islam,1985:23) යන නිර්වචනයට අනුව තේරවිලි ජනශ්‍රැතියට ආවේණික ප්‍රමුඛාංගයක් බව පැහැදිලි වේ.

කවර ජනශ්‍රැති අංගයකට වුව ද පාදක වන්නේ එය අයත් සමාජයේ සාමාජිකයන් ජීවිතය හා පරිසරය ඇසුරින් ලබන අත්දැකීම් හා හැඟීම් දැනීම් ය. ස්වකීය අවශ්‍යතා සඳහා පරිසරය ගළපා ගැනීමේදී ජනයාට ලැබෙන නානාවිධ අත්දැකීම් හා දැනුම් සම්භාරයන් මගින් ඔවුන්ගේ විඥ්ඤාණය පෝෂණය කර ගැනීම හා එය ශ්‍රැතිය ඔස්සේ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කරවීම චිරන්තන

සමාජවල ලක්ෂණයක් විය. විඥ්ඥාණය යනු ''විශේෂ වූ ඥානය"(සෝරත හිමි, 1999, පි.939) යි. ඒ අනුව ජනයා සතු විශේෂිත ඥානය 'ජන විඥ්ඥාණය' වේ. ජනයාගේ සෑම භෞතික-අභෞතික නිර්මාණයක් ම හැඩ ගැන්වෙන්නේ ඔවුන් සතු විඥ්ඥාණය පාදක කොටගත් පරිචය මත ය. ජනශ්‍රැති නිර්මාණවලට ජන විඥ්ඥාණය පදනම් වීමේ ප්‍රතිඵලය වන්නේ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීමේදී එය තව දුරටත් පෝෂණය වීම ය. ඒ අනුව කුමන ජනශ්‍රැති විශේෂයක් වුව ද එය අයත් සමාජයේ ජන විඥ්ඥාණය පිළිබිඹු කෙරෙන කැඩපතක් ලෙස භාවිත කළ හැකි ය. ඒ සඳහා ජනශ්‍රැති අංගයක මතුපිට අර්ථය ඉක්මවා ගොස් එහි අන්තර්ගත හරය ගවේෂණය කළ යුතු ය. ජනශ්‍රැතියට අයත් විශේෂ අංගයක් වන තේරවිලිවලින් ප්‍රකාශ වන නිර්මාණාත්මකභාවයට බලපා ඇත්තේ විශේෂයෙන් ම ඒවා ජන ජීවිතය හා සබැඳි ජීවී-අජීවී බොහෝ දෑ වස්තු විෂය කොට ගෙන නිර්මාණය වී තිබීමත් ඒවා නිර්මාණය කිරීමේ දී භාෂාව පිළිබඳ ව විස්තාරිත විඥ්ඥාණයක් ජනයා සතු ව පැවතීමත් යන කාරණාවන් ය.

තේරවිලි අර්ථ විග්‍රහය

"තෝරා දිය යුතු දෙය, අර්ථය සැඟවුණු කියමන හෝ වාක්‍යය හෝ කවිය"(ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, 1982, පි. 12) යන අරුත් දෙන තේරවිලි, විනෝදාස්වාදය, භාෂා ඥාණය මෙන් ම සංජානන හැකියා වර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස අතීතයේ සිට ම භාවිතයට ගැනෙන ජනශ්‍රැති අංගයකි. තේරවිලි යන පදයට "ප්‍රහෙලිකාව, පිළිතුරු දෙන්නට අපහසු ප්‍රශ්නය, පටලැවිලි සහිත ප්‍රශ්නය"(සෝරත හිමි, 1963, පි.418) ලෙසත් ප්‍රහේලිකා යන පදයට "දුර්බෝධ වූ ප්‍රශ්නය, තේරවිල්ල" (සෝරත හිමි, 1999, පි.665) ලෙසත් අර්ථ දක්වීම් අනුව ප්‍රහේලිකා යනු ද තේරවිලි සඳහා ව්‍යවහාර වූ වචනයක් බව හැඟේ. තේරවිල්ල යන්නට දී ඇති"enigma, puzzle, riddle"(හේවගේ, 2014, පි. 270) යන ඉංග්‍රීසි වචන අතර puzzle යන වචනයේ අර්ථය ද ප්‍රහේලිකා යන්න ය. සංස්කෘත සාහිත්‍යයේ ප්‍රහේලිකා වශයෙන් ව්‍යවහාර වී තිබෙන්නේ ද තේරවිලි විශේෂයකි. ප්‍රහේලිකා පද්‍යමය ස්වරූපයක් ගත්ත ද ඒවා "කවිරස විඳගැනීමට අපොහොසත් වන හෙයින් අලංකාර ගණයට නො වැටෙතැ යි කියති. එහෙත් විශ්වනාථ ශූරීහු අලංකාර ගණයට ඇතුළත් කෙරෙති. වෛචිත්‍රතාවයක් එහි ගැප් වී ඇති හෙයින් අලංකාරයක් වේ යැ යි ඔවුන්ගේ නිගමනයයි"(සුමනවංශ හිමි, 1993. පි.17) "කෙළි කවට කම් සඳහාත් මොළයට අහරක් ලෙසිනුත් ප්‍රහේලිකා පහළ වූ බව "කාව්‍ය ශාස්ත්‍ර විනෝදේන කාලො ගච්ඡති ධීමතාම්" යන සංස්කෘත කියමනෙන් පැහැදිලි වේ(ලොකුබණ්ඩාර 2000, පි.150). මේ අනුව ප්‍රහේලිකා හා තේරවිලි යන වචනවල සාම්‍යත්වය හැඳිනගත හැකි ය.

තේරවිල්ල යනු 'ගැට ගැසූ පද කැටිය' බවටත් ඒ ගැට ගසා ඇති පදවලින් කියා ඇත්තේ කුමක්ද කියා තේරිය යුතු නිසා එය තේරවිල්ල යන නම ලබන බවටත් (දිසානායක, 2010, පි.7) අර්ථකථන දී ඇත්තේ 'ගැට' යනු ද තේරවිලි විශේෂයක් ලෙස සැලකුණු බැවිනි. "අවුල් හෝ දුර්බෝධ වූ කාරණය" ගැට යන්නෙහි එක් අර්ථයකි. ඒ අනුව ගැටපද යන යෙදුම "නොතේරෙන වචනය, දුර්බෝධ පදයන්ගේ අර්ථය පැහැදිලි කළ පොත"(සෝරත හිමි, 1999, පි.984) යනුවෙන් අර්ථ ගැන්වේ. තේරවිලිවල ව්‍යවහාරයේ ස්වභාවය අනුව තේරවිලි යන්නට පර්යාය පද ලෙස ප්‍රහේලිකා සහ ගැට යන පද මුලුමනින් ම ගත නො හැකි බවක් පෙනුණ ද ඒ පදත්‍රයයෙන් ම එකම අර්ථයක් ලැබෙන බව ඇතැම් විද්වතුන්ට අනුව නිගමනය කළ හැකි ය. ප්‍රහේලිකා "ගුප්ත වැ අදහස් ප්‍රකාශ කරන, අදහස සැඟවෙන සේ යෙදෙන බන්ධන විශේෂයකි. පැරණියන් තේරවිලි කතා, දහම් ගැටය නමින් ව්‍යවහාර කෙළේ ද මේ ප්‍රහේලිකා ය"(සුමනවංශ හිමි, 1993, පි. i). බෞද්ධාගමික කරුණු අන්තර්ගත දහම් ගැට මාලය හා වෛද්‍ය ශාස්ත්‍රය සම්බන්ධ තොරතුරු අඩංගු වෙදගැට නමින් හැඳින්වෙන කවිවලට 'ගැට' යන්න ව්‍යවහාර වන්නේ ඒවා තේරවිලි ස්වරූපයෙන් රචනා වී ඇති බැවිනි. එසේ ම සන්න යන පදය ද තේරවිලි සඳහා භාවිත වී ඇත. සන්න යනු "ව්‍යාඛ්‍යාව" ලෙසත් ව්‍යාඛ්‍යාව යනු"අර්ථ විවරණය, ග්‍රන්ථයක අර්ථ පැහැදිලි කිරීමට ලියූ සන්නය" ලෙසත් සුමංගල ශබ්දකෝෂයේ සඳහන් ය(සෝරත හිමි, 1999, පි.984). ඒ අනුව තේරවිල්ලක අන්තර්ගත අර්ථය පැහැදිලි කරගැනීමේ ලක්ෂණය හේතු කොට ගෙන සන්න යන පදය ද තේරවිලි සඳහා ජනවහරට පිවිසෙන්නට ඇත. "සන්න සහිත පද කීමට වරන් ගතින්, මේ සන්නේ තේරූ කෙනෙකුන් හපනා, මේ සන්නේ තේරූ අය බුදු වෙනවා"(සිංහල ජනකවි සංග්‍රහය, 2009, පි.33)ị යනුවෙන් තේරවිලි කවිවල සඳහන් වීමෙන් ඒ බව වැඩිදුරටත් සනාථ වේ.

සිංහල තේරවිලිවල ගති ලක්ෂණ
ජනශ්‍රැතියට අයත් වන තේරවිලි, "වචන ප්‍රයෝජනයට ගෙන ඒ වචන තුළින් (කථාබහෙන්) ප්‍රකාශයට පත්වන්නා සේම, විවිධ මුද්‍රා හා සංකේත මගින් ද"(රත්නපාල, 2007,පි.266) ප්‍රකාශයට පත් ව තිබීම අනුව ඒවා ප්‍රධාන වශයෙන් වාචක සහ අවාචක ස්වරූපයෙන් හැඳිනගත හැකි ය. වාචක තේරවිලි පද්‍ය සහ ගද්‍ය වශයෙන් දෙයාකාර වන අතර අවාචක තේරවිලි ලිඛිත සහ හස්ත මුද්‍රා වැනි සංඥා ක්‍රම ස්වරූපයෙන් ව්‍යවහාර වූ බව හැඳිනගත හැකි ය. වාචක වූත් පද්‍ය ස්වරූපී වූත් තේරවිලි ජනශ්‍රැති විෂය පථයට ඇතුළත් වන්නේ තේරවිලි කවි නමිනි. ඒ සුවිශේෂ අංගයක් වන ජනකවියේ උපාංගයක් වශයෙනි. කවර ස්වරූපයේ තේරවිල්ලක වුව ද මූලික ලක්ෂණ නම් එහි කිසියම් ගැටලුවක් ඇතුළත් වීම, ඒ ගැටලුවට එක් වර ම පිළිතුරු දීම හෝ විසඳීම හෝ සුකර නො වීම සහ බුද්ධිය මෙහෙයවීමකින් මුක්ත ව එයට පිළිතුරු සෙවීම හෝ විසඳීම අසීරු වීම ආදිය යි.

කියවීමෙන් හා ශ්‍රවණයෙන් තේරවිලි රසවිඳීමට මෙන් ම ඒවා බුද්ධිය මෙහෙයවා විසඳීමටත් අද්‍යතනයේ පවා බොහෝ දෙනා කුඩා කල සිට ම අභිරුචියක් දක්වති. චිරන්තන සාම්ප්‍රදායික සමාජයේ ජනයා ස්වකීය දෛනික ශ්‍රම කාර්යයන්ගෙන් ලද විවේකය විනෝදාත්මක මෙන් ම ප්‍රයෝජනවත් ලෙස ගත කිරීමට උපයෝගී කර ගත් ජනශ්‍රැති විශේෂයක් වූ තේරවිලි, පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට ද උපකාරී වේ. කාලාන්තරයක් තිස්සේ මුඛ පරම්පරාගත ව පැවත ආ මේවා පසුව ලේඛනගත ව ඇතත් ඒවා වාචික ව නිර්මාණය වී ඇති බැවින් අවාචක ගණයට අයත් කළ නො හැකි ය. අවාචක තේරවිලි ගණයෙහිලා සැලකිය හැක්කේ අක්ෂර ප්‍රහේලිකා, චිත්‍ර බන්ධන සහ ලියා දක්වීමෙන් ඉදිරිපත් කෙරෙන තේරවිලි ය; මේවා වාචික ව ඉදිරිපත් කළ හැකි වුවත් ලියා දක්වීමෙන් තොරව ගැටලුව වටහා ගැනීම දුෂ්කර ය.

වංශකතා රචකයින් සහ සාහිත්‍යකරුවන් විසින් ස්වකීය කෘතිවලට තේරවිලි ස්වරූපී සංවාද ඇතුළත් කරනු ලැබ ඇත්තේ ද චිරන්තනයේ පටන් ම තේරවිලිවලට අතිශය ප්‍රියතාවක් ජනයා අතර පැවති නිසා විය හැකි ය. මෙරට බෞද්ධ සංස්කෘතියේ මූලාරම්භය සනිටුහන් කළ මහින්දාගමනය සිදු වූ අවස්ථාවේ මිහිඳු හිමි සහ දෙවනපෑතිස් රජු අතර සිදු වී ඇති අඹ ගසක් තේමා කොටගත් සංවාදය තේරවිලි ස්වරූපයකින් රචනා කර තිබීම ඊට නිදසුනකි (සිංහල මහාවංශය, 2004, පි.55-56)¡ තේරවිලිවලට පැරණි සමාජයේ පැවති දැඩි ඇල්ම නිසා ම ප්‍රහේලිකා ස්වරූපයේ ප්‍රශ්න හා පිළිතුරු සහිත සංවාද සාහිත්‍ය කෘතිවලට ඇතුළත් කර ඇත්තේ ඒ කෘතිවල අන්තර්ගත කරුණු පාඨක හා ශ්‍රෝතෘ ජනයාට බුද්ධිය මෙහෙයවමින් අවබෝධ කරගැනීමට අවස්ථාව සැලසීමට ය. උම්මග්ග ජාතක කතාව පුරා ම මහෞෂධ පණ්ඩිත චරිතයෙහි පාණ්ඩිත්‍යය ඉස්මතු කොට දක්වීම සඳහා උපයෝගී කරගෙන ඇත්තේ තේරවිලි ස්වරූපයේ ප්‍රශ්න හා පිළිතුරු සහිත රචනා ශෛලියකි. ඊට නිදර්ශනයක් ලෙස මහෞෂධ පණ්ඩිතයන් සහ අමරාදේවිය අතර සංවාදය දැක්විය හැකි ය. එහි දී ඒ පණ්ඩිතයන් ඇගේ නම ඇසූ විට "ස්වාමීනි, ගිය දවස වේවයි මතු දවස වේවයි දැන් වේවයි සමස්ත ලෝකයේ යමෙක් නැත්නම් මම ඒ නමයි"(උම්මග්ග ජාතකය, 2009, පි. 47-48) යනුවෙන් ඇය ලබා දෙන පිළිතුර වටහා ගැනීමට නම් එහි ව්‍යංග්‍යාර්ථය ඉක්මවන නියමාර්ථය සොයා ගත යුතු ය. තේරවිලි විසඳීමට හැකි වීම බුද්ධිමත්භාවය ප්‍රකට කරන්නක් බැවින් සාහිත්‍ය කෘතිවල නිරූපිත සුවිශේෂ චරිතවල බුද්ධිමත්භාවය පෙන්නුම් කිරීමට තේරවිලි ස්වරූපයේ සංවාද හා ප්‍රකාශ ඒවාට ඇතුළත් කෙරෙන්නට ඇත.

තේරවිලි ප්‍රභේද, ඒවායේ නිර්මාණාත්මකභාවය සහ ඉන් පිළිබිඹු වන ජන විඥානය
සිංහල තේරවිලි සියුම් ව නිරීක්ෂණය කරන විට හෙළිවන විශේෂ ලක්ෂණයක් වන්නේ ඒවායේ ආකෘතිය, භාෂා භාවිතය, රචනා ශෛලිය, වස්තු විෂය ආදි කරුණුවලින් පෙන්නුම් කෙරෙන විවිධත්වය යි. වාචක තේරවිලි ගණයෙහිලා සැලකිය හැකි ගද්‍ය හෝ පද්‍ය හෝ සිංහල තේරවිලි සරල තේරවිලි, පද පෙරළි සහිත තුන් තේරවිලි, අක්ෂර හා පද පෙරළි තේරවිලි සහ තේරවිලි කවි ආදි වශයෙන් මූලික ප්‍රභේද කිහිපයකින් හැඳිනගත හැකි ය. ඒ ප්‍රභේද යටතේ තවදුරටත් අනු ප්‍රභේදවලට බෙදා දැක්විය හැකි වුවත් මේ අධ්‍යයනයට යොදා ගැනෙන්නේ එකී මූලික ප්‍රභේද කිහිපය යි. කුමන ප්‍රභේදයකට

අයත් තේරවිල්ලක් වුව ද එහි වස්තු විෂය තීරණය කිරීම, එය ප්‍රකාශනයට උචිත ආකෘතිය තෝරාගැනීම සහ ඊට අනුකූලව භාෂාව හැසිරවීම සිදු කර ඇත්තේ නිර්මාණාත්මක ව ය. තේරවිල්ලකට වස්තු විෂය තෝරා ගැනීමේ දී ආධාර වී ඇත්තේ ජනයා ජීවිතය හා පරිසරය ඇසුරින් ලද අත්දැකීම්, ආකල්ප-සංකල්ප හා හැඟීම්- දැනීම් ආදියෙන් සමන්විත ජන විඥ්ඥාණය යි. සිංහල ජනශ්‍රුතියට දායාද වී තිබෙන්නා වූ නානාවිධ දෑ වස්තු විෂය කොටගත් තේරවිලි සම්භාරය මගින් සිංහල ජන විඥ්ඥාණයේ පුළුල් පරාසයක් විදහා පෙන්වයි. තේරවිලිවලට හැම විට ම පාහේ වස්තු විෂය වී තිබෙන්නේ දෛනික ජීවිතයේ දී පරිහරණය කෙරෙන භාණ්ඩ, මෙවලම්, උපකරණ ආදියත් පරිසරයේ නිරන්තරයෙන් ගැටෙන අහස, පොළොව, ඉර-හඳ, තාරකා, ගස්වැල්, පලතුරු, සතුන් ආදියත් මෙන් ම ගම්, නගර හා ස්ථාන ආදියත් බව ඒවා නිරීක්ෂණය කරන විට පෙනේ. බොහෝ විට අජීවී වස්තු තේරවිලිවල විස්තර කෙරෙන්නේ ජීවත්වාරෝපිත ව ය. ඒ සඳහා ව්‍යංගාර්ථවත් භාෂා විලාසයක් උපයෝගී කරගෙන ඇති බව හැඳිනගත හැකි ය. අද්‍යතන ජන සමාජයේ ද විවිධ දෑ වස්තු විෂය කොටගත් තේරවිලි ව්‍යවහාර වන්නේත් පාසල් විෂය මාලාවට තේරවිලි ඇතුළු ජනශ්‍රැති අංග ඇතුළත් කර ඇත්තේත් ඒවා පිළිබඳ හැදෑරීමේ වැදගත්කම නිසා ය.

සරල තේරවිලි

ළමා, තරුණ සහ වැඩිහිටි යන සෑම වයස් කාණ්ඩයක් අතර ම සිංහල තේරවිලි භාවිත වී ඇත. එපමණක් නොව විවිධ බුද්ධි මට්ටම්වල පුද්ගලයන්ට ගැළපෙන තේරවිලි ද වේ. දරුවන් සඳහා වූ තේරවිලි, සරල තේරවිලි ලෙස සැලකිය හැකි ය. "බහ තෝරන වියේ සිට ම පුංචි පුංචි තේරවිලි ඉදිරිපත් කොට ඒවාට පිළිතුරු ලබා ගැනීම තුළින් මෙන් ම ඒවායේ නියම පිළිතුර කියා දීමෙන් දරුවන් දැනුවත් කිරීම පැරණි ජන සමාජයේ දක්නට ලැබුණ සිරිත"(ලොකුහේවා, 2020, පි.12) වූ අතර එමගින් "ජීවිතයේ කළ යුතු නොකළ යුතු දේ විනෝදය ඔස්සේ දැනගැනීමට ලැබීමෙන් ඔවුහු මහා සමාජානුයෝජන ක්‍රියාවලියකට භාජන වන්නාහ"(රත්නපාල, 2007,පි.272). සරල තේරවිලි බොහෝ විට ළමා මනසට උචිත ආකාරයෙන් නිර්මාණය වී ඇත. තේරවිලි භාවිතයෙන් ප්‍රශ්න ඇසීමේ හා ඒවාට පිළිතුරු දීමේ අභ්‍යාස මගින් දරුවන්ගේ බුද්ධිය වර්ධනය වේ. "කැලේ තියෙන ලිය - අරලිය, අලියා නොකන දළුව- ගිනිදළුව, ගෙදර තිබෙන ගල-මිරිස් ගල, තනි කකුලේ මහත්තයා-බිම්මල, පස්සෙන් හිල ඉස්සරහින් උල, පුංචි ළිඳේ වතුර රසයි"(ලොකුහේවා, 2020, පි.13) වැනි ළමා පරපුර අතරේ වර්තමානයේ පවා භාවිතයේ පවතින තේරවිලි, සරල තේරවිලිවලට නිදසුන් ය. ඒවාට පාදක වන වස්තු පිළිබඳ ඉඟි අනියමාර්ථයෙන් සරල ව දක්වා ඇති අතර ඒ වස්තු පිළිබඳ ව ජන විඥ්ඥාණයෙහි ගැබ්ව ඇති අත්දැකීම්, හැඟීම්, දැනීම් අනුව ඒ ඉඟි ගළපා ඇත.

ළමයින් අතර වර්තමානයේ ද භාවිත වන සරල තේරවිලි ළමා මනසෙහි විචිත්‍ර චිත්තරූප මැවීමට සමත් ය. එමගින් තමා අවට පරිසරයේ පවතින හා ජීවිතයට සමීප නොයෙකුත් දෑ සෞන්දර්යාත්මක දෘෂ්ටියකින් වටහා ගැනීමට අවස්ථාව සැලසේ. පැසී ඉදී ඇති කොස් ගෙඩියක් දෙස බලා එයින් සීයා කෙනෙකුගේ චිත්ත රූපයක් මවාගැනීමට දරුවන් පොළඹවන වර්තමානයේත් ප්‍රකට තේරවිල්ල ඊට මනා නිදසුනකි. මෙහි පැසී ඉදී අත්තක් මත තිබෙන කොස්ගෙඩිය, කටුවලින් සෑදූ වස්ත්‍රයක් පොරවාගෙන නිශ්ශබ්ද ව සිටින වයෝවෘද්ධ සීයා කෙනෙකුට උපමා කර ඇති ආකාරය චිත්තාකර්ෂණීය ය. සීයා මහලු වුවත් ඔහු ජීවත් වූ කාලයේ දී ලද ජීවන අත්දැකීම්වලින් හා විඥ්ඥාණයෙන් පෙහොසත් ය. තත් ජීවන අත්දැකීම් හා පරිපාකයට පත් විඥ්ඥාණය ළමා පරපුරට යහපත් ව පැසී ඉදුණු කොස් මදුලු අනුභව කිරීමෙන් ලැබෙන පැණි රස මෙන් රසවත් හා ප්‍රයෝජනවත් වන බව ව්‍යංග්‍යයෙන් ප්‍රකාශ වෙයි. වචන කිහිපයක් සහ අචේතනික වස්තුවක් පාදක කොට ගෙන සංචේතනික පුද්ගලයකු පිළිබඳ දැවැන්ත චිත්ත රූපයක් මවන්නේ කොස් ගෙඩිය ඉදීමට පෙර ප්‍රධාන ආහාරයක් ලෙස ජනයාගේ කුසගිනි නිවීමටත් ඉදුණු පසු පලතුරක් ලෙස ආහාරයට ගැනීමටත් හැකි ආකාරය පිළිබඳ ව පවතින ජන විඥ්ඥාණය ප්‍රයෝජනයට ගනිමිනි.

"අත්තක් උඩ බුම්මාගෙන
කටු රෙද්දක් පොරවාගෙන
නාකි වුණත් පැණි බේරෙන
සීයා කවුද?"(සිරිපාල, 2023, පි.111)

කවරාකාරයේ තේරවිල්ලකින් වුව ද ඒවායෙහි නිර්මාණකරුවන් සතු ව පැවති භාෂා ඥාණය මැනවින් ප්‍රකට කෙරෙයි. තේරවිල්ලකට තෝරා ගැනුණු ජීවමය හෝ අජීවමය වස්තුව පිළිබඳව ප්‍රකාශ කිරීමට සැසඳෙන සේ පද යෙදීමට තේරවිලි රචකයා විශිෂ්ට සාමර්ථ්‍යයක් දක්වන්නේ ඔහු සතු භාෂා විඥ්ඥාණය අනුව යි. "දික් දිගට කොළ ඇති" ඊ ළඟට ගස ඇති - කන්නන්ට රස ඇති-දෙන්නන්ට අකමැති" යන ප්‍රකට තේරවිල්ලට ක්ෂණික පිළිතුරක් ලබා දීමට හැම කෙනෙකුට ම හැකි නොවනු ඇත. ගම් පෙදෙසක ජීවත් වන කෙනෙකුට නම් එය විසඳීම පහසු වනු ඇත. ඒ තේරවිල්ලට අදාළ පිළිතුර උක් ගස ය. එහෙත් කෙතරම් උක් ගස් දැක ඇතත් පිළිතුර ඒ ගස බව තේරුම් ගැනීමට යම් කාලයක් ගත වීම හෝ පිළිතුරු දීමට අසමත් වීම හෝ සිදු විය හැකි ය. මෙවැනි තේරවිලිවලින් පරිසරය පිළිබඳ අවබෝධය හා දැනුම විමසා බැලීමක් සිදුව ඇති සේ ම රචකයන්ගේ කලාත්මක පරිකල්පනය ද ප්‍රකාශ වේ.

පහත සඳහන් තේරවිල්ලට වස්තු වී තිබෙන්නේ ගොයම් කැපීමට භාවිත වූ දෑකැත්ත ය. එහි හැඩරුව හා එය භාවිතයට ගැනීමේ දී ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ලක්ෂණ කිහිපයක් දක්වෙන ඉඟි මගින්, එය වක ගැසුණු කුස හකුලා ගත්, තුඩින් ගොයම් නමැති ගොදුරු අල්ලාගෙන දති නමැති දත්වලින් ඒවා අහරට ගන්නා නමුත් කුසගිනි නොසන්සිඳෙන සත්ත්වයකුගේ චිත්තරූප මවන ආකාරය බෙහෙවින් නිර්මාණාත්මක ය. එවැනි නිර්මාණයක් බිහි කිරීමට බලපා ඇත්තේ ගොවිතැන හා සබැඳුණු ජනජීවිතය ආශ්‍රේය ජන විඥ්ඥාණය යි.

"වක්ක ගසා ගෙන වක බඩලාගෙන
තුඩින් ගොදුරුමයි ඉල්ලන්නේ
හඩ මැද්දෙන් දත් ගණනක් ඇත
කැවට ඒ බඩ නොපිරෙන්නේ"(ලොකුහේවා, 2020, පි.13)

ළමා මනසට උචිත ලෙස භාෂාව හසුරුවමින් ප්‍රස්තුත වස්තුව පිළිබඳව විසිතුරු සංකල්ප මවමින් නිර්මාණය වූ මෙවැනි සරල තේරවිලි ළමා පරපුරට විනෝදය මෙන් ම තමා අවට පරිසරය පිළිබඳ අවබෝධය ද ලබා දීමෙහි සමත් ය. ඇතැම් සරල තේරවිලි ඉතාමත් සීමිත පද සංඛ්‍යාවකින් නිර්මාණය වී තිබෙනු දැකිය හැකි ය. පොල් ගසේ අත්තක් තේමා කර ගැනුණු, වචන නවයකින් සමන්විත මතු දක්වෙන තේරවිල්ල පොල් ගසකින් අත්තක් වැටීමේ සංසිද්ධිය පදනම් කරගෙන නිර්මාණය කර ඇත. වියළි පොල් අත්තක් ගසෙන් බිමට වැටෙද්දී එය ගසේ ස්පර්ශ වීමෙන් ජනනය වන ශබ්දයත් එය කණ වැකී සුනඛයකු බුරන ශබ්දයත් සුනඛයා ගස මුලට දිව එන විට ඒ පොල් අත්ත උගේ පිටට පතිත වීමෙන් උෟ කෑ ගසන ශබ්දයත් පිළිබඳව පද කිහිපයකින් ඉඟි සපයා ඇති ආකාරය නිර්මාණාත්මක ය. පරිසරයේ යම් යම් සංසිද්ධි පිළිබඳ සියුම් නිරීක්ෂණයෙන් ලද අත්දැකීම් මගින් ගොඩනැගුණු ජන විඥ්ඥාණය මෙවැනි තේරවිලිවලින් මැනවින් නිරූපණය වේ.

"ශ්‍රාස්ස! ශ්‍රාස්ස!! කී
බුඃ බුඃ.....කී
බැ......බැ......කී" (හෙළමග විසිතුරු, 2003, පි. 237)

පද දෙක තුනකින් පමණක් සමන්විත සරල තේරවිලි විසඳීමේ දී, ඒ පදවලින් ප්‍රකාශිත අර්ථ අනුව සිත මෙහෙයවා පිළිතුර සොයා ගත යුතු ය. "අලියා නොකන දළුව = ගිනි දළුව, කැලේ තිබෙන ලිය = අරලිය, ගෙදර තියෙන ලිය = ඇතිලිය, වෙලේ කඬේ = වක්කඬේ, ගෙදර තිබෙන ගල = මිරිස් ගල, නාන්ට බැරි විල = කරවිල"(ලොකුහේවා, 2020, පි.19) වැනි තේරවිලි ඊට නිදසුන් ය.

ඇතැම් තේරවිලි සරල වුවත් ඒවා නිර්මාණය වී තිබෙන්නේ ළමයින් සඳහා නොව තරුණ හා වැඩිහිටි ජනයාගේ භාවිතය සඳහා බැවින් ඒවායේ පද සංයෝජනයෙහි ඕලාරික බවක් දැකිය හැකි ය. "උල් දෙකයි හිල් දෙකයි -රෙද්ද අස්සෙමයි රිංගන්නේ"(ලොකුහේවා, 2020, පි.108) යන තේරවිල්ලේ මතුපිට

අර්ථය හාස්‍යජනක වුවත් එය තේරූ විට ලැබෙන පිළිතුර දෛනික ජීවිතයේ දී පරිහරණය කෙරෙන කතුර ය. එය භාවිත කරන ආකාරය පිළිබඳ ව ජන විඥානයේ ගැබ්ව ඇති අත්දැකීම් අනුව එයට ජීවත්වාරෝපණයක් ලබා දී තේරවිල්ල නිර්මාණය කර තිබේ. මෙවැනි විවිධ කාර්යයන් සඳහා භාවිත කෙරෙන භාණ්ඩ ජීවත්වාරෝපිත ව තේරවිලිවලට තේමා කර ගැනීමට බලපා ඇත්තේ ස්වකීය ජීවිතයට ඒවායින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව ජන විඥානයෙහි පවතින සංකල්පනාවන් ය. කතුරේ හැඩය සහ එහි ක්‍රියාකාරිත්වය තේරවිලි නිර්මණකරුවා ග්‍රහණය කොට ගෙන ඇත්තේ සචේතනික ක්‍රියාවක් ආකාරයෙනි. මෙහි 'රෙද්ද අස්සෙමයි රිංගන්නේ' යන යෙදුම වැඩිහිටි මනසට විනා ළමා මනසට උචිත නො වේ.

පද පෙරළි සහිත තුන් තේරවිලි

සිංහල තේරවිලි අතුරින් ළමා, තරුණ හා වැඩිහිටි සැම කෙනෙක් ම පාහේ භාවිත කරන තේරවිලි විශේෂයක් ලෙස තුන් තේරවිලි සැලකිය හැකි ය. වැඩිහිටියන් හා දරුවන් එකතු වන අවස්ථාවල දී තම-තමන්ගේ හපන්කම් හා උගත්කම් දක්වා ලීමටත් විනෝදාංශයක් ලෙසත් මෙවැනි තේරවිලි විසඳීම සිරිතක් ව පැවතුණි. තුන් තේරවිලි අතර ද සරල මෙන් ම සංකීර්ණ ඒවා ද දක්නට ඇත. මේ වර්ගයේ තේරවිලි නිර්මාණය වී ඇත්තේ පියවර තුනකින් යුක්ත ව ය. පළමු පියවරේ දී තේරිය යුතු පද දෙකක් ඉදිරිපත් කෙරේ. දෙවන පියවරේ දී ඒ පද දෙකට සමානකමක් දක්වන වෙනත් පද දෙකක් ඉදිරිපත් කිරීම සිදු වන අතර ඒ පද දෙකෙහි මුල් අක්ෂර මාරු කොට පිළිතුර සකස් කර ගැනීම තෙවෙනි පියවර වේ. ඒ අනුව මේ තේරවිලිවල පිළිතුරු සොයා ගැනීමට හැකි වන්නේ පද පෙරළි මගිනි. මෙවැනි තේරවිලි බැලූ බැල්මට සරල ස්වරූපයක් පෙන්නුම් කළ ද ඒවා නිර්මාණය කිරීමටත් විසඳීමටත් තාර්කික මනසක් අවශ්‍ය වේ. තුන් තේරවිලිවල ස්වරූපය පහත නිදර්ශන මගින් හැඳිනගත හැකි වේ.

පළමු පියවරː	අවුරුදු දූරිය
දෙවෙනි පියවරː	අවුරුදු නම් වස්, දූරිය නම් කෙල්ල
තෙවෙනි පියවරː	වස්+ කෙල්ල > කෙස්වල්ල (සිරිපාල, 2023, පි.122)

පූර්වෝක්ත පද දෙකෙහි 'ව' සහ 'කෙ' යන මුල් අක්ෂර මාරු කර කෙස්වල්ල යන පිළිතුර සකස් කර ඇත. කෙස්වල්ල ස්ත්‍රීන්ට සම්බන්ධ දෙයකි. ඒ නිසා දූරිය යන ඉඟිය මෙහි පිළිතුර සොයා ගැනීමට හැකිවන සේ ගළපා ඇත. මිනිස් සිරුරේ අංගෝපංග සම්බන්ධ ජන විඥාණය මෙයින් විශද කෙරෙයි. තුන්තේරවිලිවලට නිදර්ශන ලෙස "ස්වල්ප වනය-මදවල-වදමල, කළුවර මුහුණ-අඳුරු වත-වඳුරු අත, සල්ලි කඩුල්ල-මිල වැට-වැලමිට, තියුණු යහන-උල් සයන-සල් උයන, බිබිල චන්ද්‍රයා-ගඩු-හඳ-හඩු ගඳ, වනචර සිතිවිලි-වල් සිත්-සිල්වත්"(ලොකුහේවා, 2020, පි.111) ආදිය දැක්විය හැකි ය.

ජන ජීවිතයේ සුවිශේෂ අවස්ථාවක් වන විවාහය පාදක කරගත් මනමාලි බැලීමට යාමේ චාරිත්‍රයේ දී මනාලිගේ පාර්ශ්වය විසින් මනාලයාගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා නොයෙකුත් උපක්‍රම භාවිත කරනු ලැබ ඇත. එහි දී ඔහුගේ බුද්ධි මට්ටම මැන බැලීමට තුන් තේරවිලි ද භාවිත කර තිබේ. තුන් තේරවිලිවලට පිළිතුරු දීමට මනාලයා සමත් වීම මත විවාහ යෝජනාවල ස්ථිරතාව තීරණය වී ඇති අයුරු "තුන් තේරුවේ තෝරලයි මං ඔය කෙල්ල කැන්දන් ආවෙ"(ලොකුහේවා, 2020, පි.109) යන පැරණි කියමනෙන් පැහැදිලි වේ.

අක්ෂර හෝ පද පෙරළි හෝ සහිත තනිපද හා දෙපද තේරවිලි

සිංහල තේරවිලි අතර ඉතා ම කෙටි තේරවිලි විශේෂය වශයෙන් හැඳිනගත හැක්කේ අක්ෂර හා පද පෙරළියට ලක් කර විසඳිය යුතු තනිපද හා දෙපද තේරවිලි ය. දෙපද තේරවිල්ලක් වුව ද උච්චාරණය කිරීමේ දී තනි පදයක් ලෙස ද තනිපද තේරවිල්ලක් දෙපදයක් ලෙස ද ශ්‍රවණය වීමට ඉඩ තිබේ. " මදවල-වදමල, වලාහත-හලාවත, වළකර-කළුවර, මල්හොන-හොල්මන, මහිදෙල-දෙහිමල, පරබතළ-බරපතළ"(ලොකුහේවා, 2020, පි.26) ආදිය තනිපදයේ අක්ෂර පෙරළි සහිත තේරවිලිවලට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. තනි පදයක මුල හා මැද අක්ෂර මාරු කොට පිළිතුරු සෙවිය යුතු මේවා විනෝදය සඳහා මෙන් ම යම් පණිවිඩයක් සඟවා ප්‍රකාශ කිරීම සඳහා ද ව්‍යවහාර වී තිබේ.

දෙපද තේරවිලිවල පද පෙරළිය සිදුවන්නේ වචනද්වයෙහි මුල් අක්ෂර මාරු කිරීමෙනි. ඒ වචන ද්වයෙන් පැහැදිලි අර්ථයක් නො ලැබේ; නැතහොත් අනාර්ථයක් ලැබේ. එහෙත් ඒ පදවල මුල් අක්ෂර මාරුකොට ගැළපූ විට පැහැදිලි අර්ථයක් ලද හැකි ය. මේ ගණයේ තේරවිලිවලට නිදසුන් ලෙස " වනුමා හන්නම-හනුමා වන්නම, වත්තල පිංගෙඩිය-පිත්තල වංගෙඩිය, කන්ඩි නොකුල-නොන්ඩි කකුල, තොම්බිගෙ තප්පිය-තම්බිගෙ තොප්පිය, වහෙන් ඔරෝ-ඔහෙන් වරෝ"(සිරිපාල, 2023, පි.126) යනාදිය දක්විය හැකි ය. මෙවැනි පද පෙරළි ගණයට අයත් තේරවිලිවලින් විශේෂයෙන් පිළිබිඹු කෙරෙන්නේ ඒවා නිර්මාණය කළ හා ඒවා ව්‍යවහාර කරන ජනයාගේ නිර්මාණශීලීත්වය සහ භාෂාව පිළිබඳ පරිචය යි.

තේරවිලි කවි

වාචක තේරවිලි අතර කවිය මාධ්‍ය කොටගෙන නිර්මිත තේරවිලි කවි සුවිශේෂ තැනක් ගනී. තේරවිලි සිව්පද වශයෙන් ද හැඳින්වෙන මේවා ජනකවි විශේෂයක් ලෙස ජනයා අතර බෙහෙවින් ප්‍රචලිත වී තිබේ. සතර පදයක ආකෘතියෙන් නිර්මාණය වූ එක් කවියකින් ප්‍රශ්නය ද තවත් කවියකින් පිළිතුර ද ඇතුළත් බොහෝ තේරවිලි කවි උභය භාෂණ ලක්ෂණයෙන් යුක්ත ය. පහත සඳහන් තේරවිලි කවියේ මුල් පැදි පේළි තුනෙන් ඊට අදාළ පිළිතුර වන වැටකේ ගෙඩිය පිළිබඳ ඉඟි කිහිපයක් ප්‍රකාශ කොට අවසන් පේළියෙන් තෝරා දෙන ලෙස පැවසෙයි. ඊට පිළිතුරු කවිය නිර්මාණය කර ඇත්තේ තේරවිල්ල ඉදිරිපත් කරන කවිය ම සුළු වෙනස්කම් සහිත ව ප්‍රතිනිර්මාණය කිරීමෙන් වීම විශේෂ ලක්ෂණයකි.

"උරණ වෙලා උඩ සිටිතෙයි කියාපන්
පරණ වෙලා බිම වැටෙතැයි කියාපන්
මුහුණ පුරා නියපොතු ඇත කියාපන්
මුහුණ පුංචි ලිය තෝරා කියාපන්

උරණ වෙලා උඩ උන්නත් කාරි නැත
පරණ වෙලා බිම වැටුනත් කාරි නැත
මුහුණ පුරා නිය ආවත් කාරි නැත
මුහුණ පුංචි ලිය වැටකේ ගෙඩිය වෙත"
(තිලකරත්න,1971,පි.120)

මෙවැනි තේරවිලි කවි සංවාද ස්වරූපයෙන් සැකසී තිබීම හේතුවෙන් උභය භාෂණ ලක්ෂණ පෙන්වයි. එක් පුද්ගලයකු විසින් ගායනා කරන තේරවිලි කවියට තවත් පුද්ගලයකු විසින් පිළිතුරු කවිය ගායනා කිරීම එවැනි තේරවිලිවල දැකිය හැකි ය. කක්කුට්ටා තේමා කර ගැනුණු පහත තේරවිලි කවි යුගලය සංවාදාත්මක ස්වරූපයෙන් නිර්මාණය වූවකි. ඒ සත්ත්වයා හා සබැඳි ජනප්‍රවාද හා උගේ ශරීරයේ ස්වභාවය පිළිබඳ ජන විඥානය පාදක කර ගෙන එහි ඉඟි දක්වා ඇති ආකාරයෙන් නිර්මාණකරුවාගේ කලාත්මක පරිකල්පනය පිළිබිඹු වේ.

"සස්සඳ ගලේ ගල පල්ලේ උපන් නේ
ඔලුව නැතුව කඳමයි සාප දුන් නේ
නෙත් දෙක උඩ බලා බිම ගොදුරුම කන් නේ
මෙතුන් පදේ තෝරාලා කියන් නේ

සස්සඳ ගලේ ගල පල්ලේ උපන් සතා
ඔලුව නැතුව කඳමයි සාප දුන් සතා
නෙත් දෙක උඩ බලා බිම ගොදුරු කන සතා
දැනගත් මිතුර කක්කුට්ටා නොවෙද සතා"(Wijesekara, 1990,P. 305)

තේරවිලි කවි ද සෙසු ජනකවි සේ ම පොදු ජන නිර්මාණ වශයෙන් ව්‍යවහාරයේ පැවතිය ද ඇතැම් ඒවාට කර්තෘත්වයක් දී ඇති අවස්ථා තිබේ. එවැනි කවි "සිංහල රජුන්ගේ වන්දිභට්ට මණ්ඩලය"(සෝරත හිමි, 1998, පි.249), "රජමැඳුරෙහි කාව්‍යකාර සමූහය"(පීරිස්, 1964, පි. 363), "සිංහල රජුන් දවස කිවිවරුන් වැනි කලාකාමීන් රැස් වූ මහවාසලට සම්බන්ධ මණ්ඩපය"(ධම්මින්ද හිමි සහ තවත් අය, 1982, පි. 2467) යනාදි වශයෙන් හැඳින්වුණු රාජ සභා කවිකාරමඩුවට සම්බන්ධ වී හුන් ඇතැම් කවීන් විසින් රචනා කරන ලද බව කියැවේ. ඊට නිදසුනක් වශයෙන් රාජසභා කවියකු වූ බව කියැවෙන අඹන්වල රාල නම් කවියා විසින් තම ගෝලයින්ට ගොතා කියන ලද ගිරය ප්‍රස්තුත කොටගත් තේරවිලි කවියක් හා ඊට පිළිතුරු වශයෙන් ගෝලයින් විසින් ගොතා කියන ලද කවිය දැක්විය හැකි ය. ගිරයේ තිඹිරිගෙය වන කම්මල තුළ නිමැවෙන එහි හැඩරුවත් නිමැවුම් ක්‍රියාවලියත් පිළිබඳව ඉඟි නිර්මාණාත්මක ව ප්‍රකාශිත ඒ කවිවලින් කම්මල් වෘත්තිය සහ ඒ ආශ්‍රේය නිමැවුමක් වන ගිරය පිළිබඳ ගැඹුරු ජන විඥානය පිළිබිඹු කෙරේ.

"පා දෙක නැත දුර ගමනක් බැරි හේමා
නෙත් දෙක නැත කිසි ගමනක් නෑ හේමා
ගඟේ බොරදියෙන් පණ රැකුණා හේමා
ගෝලයිනි මෙපද තේරුන් බෑ හේමා

වනන්තරේ ගල් උනුවෙනවා හේමා
ගමේ කම්මලේ නයිදෙගෙ වැඩ හේමා
වලේ බොරදියෙන් පණ රැකුණා හේමා
ගුරේ මෙපද ගිරයට කීවා හේමා"(දනන්සූරිය, 1996, පි.290-291)

තේරවිලි කවි අතරට සම්පූර්ණයෙන් ම පද පෙරළි සහිත පද සංයෝජනයෙන් නිර්මාණය වූ තේරවිලි කවි ද අයත් වේ. පහත සඳහන් වන්නේ සියලු ම වචන පද පෙරළියට ලක් කොට රචිත තේරවිලි කවියක් හා පද පෙරළි ඉවත් කොට නිර්මිත පිළිතුරු කවිය යි. මේ කවියෙන් එකවර කිසිදු අර්ථයක් වටහාගත නොහැකි වුව ද පද පෙරළි ඉවත් කිරීමෙන් සැබෑ අර්ථ සොයා ගත හැකි ය. මෙවැනි තේරවිලි කවි නිර්මාණය කිරීමට මනා භාෂා පරිචයක් තිබිය යුතු ම ය.

"කාන්නු ගොයියක් කන්දේ ලාලා පන්දලාලු යි
කයි ගොන් මීයෙක් කාලේ වෙලා පලවේලු යි
කාරෝ උයියක් කානේ හේලා පාන හේලු යි
කල්ලෝ බයියක් කටවරලා කීලු කිම යි

ගෝන්නු කයියක් ලන්දේ කාලා ලන්ද පාලු යි
මී ගොන් කයියක් වෙලේ කාලා වෙල පාලු යි
ඌරෝ කයියක් හේන කාලා හේන පාලු යි
බල්ලෝ කයියක් වට කරලා කිම කීලු යි"(අලුත්ගේ, 1998, පි.208)

පද්‍යයෙන් ප්‍රශ්නය ඉදිරිපත් වුව ද පිළිතුර වචනයෙන් ප්‍රකාශ කළයුතු තේරවිලි කවි ද වේ. මෙවැනි තේරවිලිවල කවි පදවලින් දී ඇති ඉඟි අනුව බුද්ධිය මෙහෙයවා පිළිතුර සොයා ගත යුතු ය. මිනිස් සිරුරේ සුවිශේෂ අවයවයක් වන දත් පිළිබඳ ව කවියෙන් ප්‍රකාශිත මේ තේරවිල්ලෙහි දත් සංචේතනික වස්තුවක් ලෙස සලකා තිබේ.

"නුඹ එනදා මම ආවෙත් නැති සන් දා
අතරක ඇවිත් දූන් මට කරනා නින් දා
නොයෙක් රස බොජුන් කැවෙත් නුඹ සන් දා
මට වද නොදී පලයන් මෙන්න වැන් දා"(සිරිපාල, 2023, පි.110)

පහත දැක්වෙන, පොල්ගස පිළිබඳ තේරවිලි කවියේ පොල් ගසේ අංග හා ස්වභාවය පිළිබඳ ඉඟි ලබා දී ඇත්තේ එයට ජීවත්වාරෝපණයක් දෙමිනි.

"කන්ද උඩු ගුවන ගස උඩ ලඳක් ඇති
ගොල්ල සැවොම ඇවිදිල්ලා පවන් සෙති
බෙල්ල එකයි එන ඔළුගෙඩි ගණන් නැති
ලෙල්ල නැතිව බිම ඇනවන කෙනෙක් නැති"(බණ්ඩා, 2002, පි.102)

අක්ෂර ප්‍රහේලිකා කවි ද තේරවිලි කවි ප්‍රභේදයකි. මේවා නිර්මාණයට මෙන් ම විසඳීමට ද හැකි වන්නේ මනා භාෂා ඥාණයක් ඇති කෙනෙකුට ය. පුද්ගලයින්ගේ භාෂා දැනුම පිරික්සීමට මෙන් ම යම් තොරතුරක් රහසිගත ව හෝ වක්‍රාකාරයෙන් හෝ ප්‍රකාශ කිරීමට මේ ගණයේ තේරවිලි උපයෝගී කර ගන්නට ඇතැයි සැලකිය හැකි ය. එවැනි අක්ෂර තේරවිලිවල අඩංගු වන්නේ ප්‍රශ්නයක් නොව යම්කිසි රහස් පණිවිඩයක් හෝ ප්‍රකාශයකි. මේ ගණයේ තේරවිලි රචනා කිරීමට පමණක් නොව කවියේ අන්තර්ගත ගැටලුවලට පිළිතුරු සොයා ගැනීමටත් මනා භාෂා ඥාණයක් තිබිය යුතු ය. මේ කවියෙන් කියැවෙන ප්‍රකාශය නම් අවුරුද්දට අවශ්‍ය මස් මාලු කෙවුල් වැද්දන් දෙන මුත් බත් සඳහා අවශ්‍ය කරන වී ලැබී නොමැති බවකි. මෙහි දී වී පිළිබඳ ව ඉඟිය ලබා දෙන්නේ සිංහල හෝඩියේ ළ අක්ෂරය ළඟට ඇති ව අක්ෂරයට ඉස්පිල්ල එක් කළ විට සෑදෙන වී අක්ෂරය මගිනි.

"අවු යනු රු යනු දෙක බැඳි ද යනු කිට්ටු වේ
හ යනු අල්තයනු අනු බවට මුට්ටු වේ
මා යනු ලු යනු දෙති වැදි කෙවුල් කේට්ටු වේ
ල යනු ළඟ අකුරු ඉස්පිල්ල පූට්ටු වේ"(අලුත්ගේ, 1998, පි.86)

සාම්ප්‍රදායික ජන සමාජයේ විවාහ මංගල උත්සවවල දී විනෝදාස්වාදය ලැබිම සඳහාත් මනාල යුවලගේ දෙපාර්ශ්වය අතර බුද්ධි මට්ටම් පරීක්ෂා කිරීම සඳහාත් තේරවිලි උපයෝගී කරගෙන තිබේ. මංගල කෑම මේසයට තේරවිලි ව්‍යඤ්ජනයක් එක්කිරීමත් එය තේරීමෙන් පසු ආහාර ගැනීමත් සිදුව ඇති අතර එය තේරීම අපහසු වුවහොත් අඩුපාඩුවක් ලෙස සැලකුණු බව පැවසේ (හෙළමග විසිතුරු, 2003, පි. 95)¡ මෑත කාලයේ පවා විවාහ මංගල අවස්ථාවල තේරවිලි කවි භාවිත කර ඇති බවට වාර්තා පවතී. මේ එවැනි තේරවිලි කවියකි.

"රැකල බලලා හරිබරි ගැහිලා කුප්පි එළියෙනුයි පැදුර එළන් නේ
බෑදෙක පිහලා රෙදි කැටි කරලා යට උලෙ උඩහිල වද්දන් නේ
නැහැක ටික ටික හිලට එබූ කල බෑ දෙක අතරින් වැගිරෙන් නේ
මේ ටික තෝරා දීලයි ගජයෙනි මගුල්පොලේ අද බත් කන් නේ"

"රැකල බලලා හරිබරි ගැහිලා පැදුර එළාලයි හැඩ වෙන් නේ
බෑදෙක පිහලා ඉනවත උඩලා කලවා දිගහැර ඉඳගන් නේ
දීගෙක ගියදා කෝඩුකාරි මෙය ටික දිනකින් හුරු කර ගන් නේ
මේ ටික සකියනි කුරහන් ගලටයි මේ පද ගෙතුවේ දැනගන් නේ"(මානෑව, මහතලා ජනවහර, පි.234)

ඉහත තේරවිලි කවියේ භාෂාව භාවිත කර ඇත්තේ විවාහ මංගල අවස්ථාවකට උචිත ආකාරයෙනි. මංගල දිනය යනු විවාහක යුවලගේ ලිංගික ජීවිතය ආරම්භ කෙරෙන සුවිශේෂී දිනය බැවින් ලිංගිකත්වය පිළිබඳ චිත්‍රයක් මනසේ මැවෙන පරිදි වචන ගළපා තේරවිල්ල නිර්මාණය කර ඇත. මෙය විසඳීමට නම් මතුපිටින් හැඟෙන අර්ථය ඉක්මවා සැබෑ අර්ථය සොයා ගැනීමට බුද්ධිය මෙහෙයවීමට සිදු වේ. තේරවිලි රචකයාගේ නිර්මාණශීලීත්වය මෙන් ම කුරහන් ගලේ ක්‍රියාකාරිත්වය ලිංගික කාර්යයට ගැළපීමට ඔහු සතුව පැවති විඥ්ඥාණය මේ පද්‍යයෙන් හඳුනා ගත හැකි ය.

ප්‍රස්තුත වස්තුවේ ස්වභාවය වෙනත් දෙයකට ආරෝපණය කර දක්වමින් ඉඟි ප්‍රකාශ කිරීම බොහෝ තේරවිලිවල විශේෂ ලක්ෂණයකි. කාව්‍ය ශාස්ත්‍රයේ අන්‍යාලාප නමින් හැඳින්වෙන වක්‍රෝක්ති ක්‍රමයට මෙය සමාන ය. තේරවිල්ලට වස්තු කොට ගැනෙන දේ ව්‍යංග්‍යයෙන් ප්‍රකාශ කිරීම මෙහි දී සිදු වන අතර ඒ වස්තුව පිළිබඳ ව ව්‍යංග්‍යාර්ථ ජනනයට ගැළපෙන අර්ථය මෙන් ම ශබ්දය මූලික කරගත් පද සංයෝජනයක් බොහෝ තේරවිලි කවිවල දැකිය හැකි ය. තේරවිල්ල හා පිළිතුර අඩංගු පහත පද්‍ය යුගලය එවැන්නකට නිදර්ශනයකි. මෙහි ප්‍රස්තුත වස්තු වන ගෝනා, ලේනා කුකුළා සහ කිඹුලා යන සතුන්ගේ ශබ්ද මුල් කරගත් ව්‍යංග්‍යාර්ථ දනවන පරිදි පද සංයෝජනය කර තිබීමෙන් එහි නිර්මාණාත්මකභාවය තීව්‍ර කෙරෙයි.

"ටං ටං ගාන්නා තෝරා එවාපන් - ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
මග වැලි පිසින්නා තෝරා එවාපන් - දෙගංබඩ රජා තෝරා එවාපන්

ටං ටං ගාන්නා ගෝනා නො වේ දෝ - ටිං ටිං ගාන්නා ලේනා නො වේ දෝ
මගවැලි පිසින්නා කුකුළා නො වේ දෝ - දෙගංබඩ රජා කිඹුලා නො වේ දෝ"(සිංහල ජනකවි සංග්‍රහය,2009), පිටු ix-x)

තේරවිලි කවි අතරට දහම් ගැට හා වෙදගැට ද අන්තර්ගත ව ඇත. බුදුදහම පිළිබඳ කරුණු තේරවිලි ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම සඳහා දහම් ගැට යන කවි විශේෂය බිහි වී තිබේ. මතුපිටින් සරල ජන කවි ලෙස දැකිය හැකි වුවත් ගැඹුරු දහම් කරුණු සන්නිවේදනය කිරීම දහම්ගැටවල ලක්ෂණය යි. මේ කවිවල තේරවිල්ලක මෙන් තේරීම සඳහා ඉඟි දැක්වීමක් සිදු නො වේ. මෙවැනි කවියක පද සංයෝජන මගින් ප්‍රකාශ වන්නේ ඉතා සරල හා හාස්‍යජනක ප්‍රකාශයක් වුවත් සැබවින් ම ඇත්තේ ඊට ඉඳුරා ම වෙනස් ගැඹුරු දහම් කරුණකි. ඇතැම් විට වඩාත් ඕලාරික ව නිර්මාණය වූ කවි ද වේ. එබඳු තේරවිල්ලකට නිදසුනක් ලෙස රාග, ද්වේෂ, මෝහයන් වනසා ඉපදීම නැති කර ගන්නා මෙන් (විමලවංශ හිමි, 1964,පි.265) ධර්මෝපදේශයක් දෙන පහත කවිය දැක්විය හැකි ය.

"ඉස්සන් මරා පිය - රා කළයක්ම බී පිය
මෝව අඹවා පිය - ඒත් බැරි නම් මාව කා පිය

දහම්ගැට මාලය නම් කාව්‍ය කෘතියෙහි අන්තර්ගත වී ඇත්තේ මෙවැනි ගණයේ කවි ය. එහි එන පහත කවියෙහි පයියා යන පදය නූතන භාෂා ව්‍යවහාරයට අනුව අසභ්‍ය විය හැකි නමුත් එහි අර්ථය " පසුම්බිය"(සෝරත හිමි, 1999, පි.556) යන්න ය. ඒ පදය යොදා ඇත්තේ ශරීරය පසුම්බියකට උපමා කිරීමට ය. අස්ථි සන්ධි අටසියයක් ඇත්තා වූ, නහරවැල් නවසියයකින් බැඳුණා වූ, පාද දෙකකින් උසුලාගෙන යන්නා වූ මේ ශරීරය කුමන තැනක දී විනාශයට (මරණයට) පත්වේදැයි පැවසිය නොහැකිය යන්න මේ කවියේ අන්තර්ගත වන ධර්මෝපදේශය යි.

"අටසියයක් කඩ සන්දිත් ඇති පයියා
නවසියයක් වැල් බානින් බැඳි පයියා
කරු දෙකකින් උසුලාගෙන යන පයියා
කොතන දමන්දෝ නො දැනෙයි කයි පයියා"(ධම්මානන්ද, 1986, පි¡59)

ගැඹුරු දහම් කරුණු තේරවිලි ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ අරමුණ වී ඇත්තේ එවැනි තේරවිලි විසඳීම මගින් ලබන විනෝදයට සමගාමී ව එහි අන්තර්ගත දහම් කරුණු පිළිබඳ ව ද ජනතාව ඥානනය කරවීම ය.

වෙදගැට ද එක්තරා ආකාරයක තේරවිලි විශේෂයකි. විවිධ ඖෂධ වර්ගවලට භාවිත අන්වර්ථ නාම රාශියක් මෙවැනි කවිවල අන්තර්ගත වේ. බෙහෙත් වර්ගවල නම් ඍජු ව නොපවසා තේරවිල්ලක ආකාරයෙන් දක් වූ කල, එය විසඳා නිම වන විට ලැබෙන්නේ කිසියම් රෝගයකට භාවිත වුණු දේශීය

ඖෂධ සංයෝගයකි. ඊට නිදසුන් ලෙස කුස රුජාවක් සඳහා භාවිත දේශීය වෛද්‍ය ප්‍රතිකර්මයක් පිළිබඳ වෙදගැටයක් පහත දැක්වේ.

"දේසේ උපන් සුද්දන්ගේ මස් රැගෙන
දරුවන් වදන වඳ ගැනිගේ කැවුතු ගෙන
නුවණ ඇති අයගෙ මුලකොන කඩා ගෙන
දුන් කල කුසරුජා ගුල්මත් වේය ගුණ"(හෙළමග විසිතුරු, 2003, පි. 184)

පූර්වෝක්ත පද්‍යයේ 'දේසේ උපන් සුද්දන්' යනුවෙන් සුදුලූනු ද 'දරුවන් වදන වඳ ගැනිගෙ කැවුතු' යනුවෙන් අමු වදකහ ද 'නුවණ ඇති අයගෙ මුලකොන' යනුවෙන් අමු ඉඟුරු ද අර්ථ ගන්වා ඇති ආකාරය නිර්මාණාත්මක ය. දේශීය වෛද්‍ය ක්‍රමයේ ආරක්ෂාව සඳහා මෙවැනි තේරවිලි ස්වරූපී පද සංයෝජන ඉවහල් වූ බව සිතිය හැකි ය.

සමාලෝචනය

තේරවිලි නමැති ජනශ්‍රැති අංගය බිහිවූයේත් සක්‍රිය ව ජනයා අතර ව්‍යවහාර වූයේත් ශ්‍රැති මාධ්‍යයෙන් පරම්පරාන්තර ව සම්ප්‍රේෂණය වූයේත් පුරාණ සාම්ප්‍රදායික සිංහල ජන සමාජය ඇසුරේ ය. අද්‍යතනයේ මෙන් නානාවිධ දියුණු ජන මාධ්‍ය හා අන්තර්ජාල සමාජ මාධ්‍ය නොතිබුණු ඒ ජන සමාජවලට ජනශ්‍රැති අංග තරම් ප්‍රබල මාධ්‍යයක් නො වී ය. සන්නිවේදනය, විනෝදය, දැනුම සහ බුද්ධි වර්ධනය සඳහා එකල ජනයා ඒ ඒ කාර්යයන්ට සැසඳෙන වාචක සහ අවාචක ජනශ්‍රැති විශේෂ නිර්මාණය කරගත්තේ ය. අනාදිමත් කාලයක සිට සිංහල ජන සමාජයේ පැවතෙන තේරවිලි නිර්මාණය වී ඇත්තේ කිසියම් ප්‍රස්තුතයක් පාදක කොටගෙන එය කවරක්දැයි ඍජුව නොකියා ඒ පිළිබඳ යම් යම් ඉඟි පමණක් ඇතුළත් කර පදයක, පද කිහිපයක, වැකියක හෝ පද සතරේ කවියක ස්වරූපයෙනි. ඒවායේ පිළිතුරු වාචික ව අපේක්ෂා කරන නමුත් කවි ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන තේරවිලිවල පිළිතුර කවියෙන් ම අපේක්ෂා කෙරේ. බැලූ බැල්මට හුදෙක් විනෝදය පිණිස භාවිත වූ ජනශ්‍රැති විශේෂයක් ලෙස විද්‍යමාන වුව ද ඒවා භාවිතයෙන් ජනයා ලද ප්‍රයෝජන අතිශය වැදගත් ය. තේරවිල්ලක් පැවසීමටත්, එය අසා සිටීමටත් කණ්ඩායම් දෙකක් හෝ අඩුම තරමින් පුද්ගලයන් දෙදෙනකුවත් අවශ්‍ය වේ. තේරවිල්ලට නිවැරදිව පිළිතුරු සොයා ගැනීමට නම් තේරවිල්ල නිසි පරිදි වටහා ගැනීමට එය ප්‍රකාශ කරන තැනැත්තාට මනා සේ සවන් දිය යුතු ය. එසේ තේරවිලිවලට සවන් දීම හා පිළිතුරු දීම පුරුද්දක් බවට පත් වූ විට යමක් සාවධානව ශ්‍රවණය කිරීමේ පරිචය හිමි වේ. එක්වර ම පිළිතුරු දිය හැකි බෙහෙවින් සරල තේරවිලි ඇතත් ඒවාට පිළිතුරු සෙවීම බුද්ධිමය කාර්යයක් වේ. ඉඟි පිළිබඳ සිත මෙහයවීම, පිළිතුර පිළිබඳ අනුමාන ඉදිරිපත් කරමින් තර්ක කිරීම ආදි ක්‍රියාවන් චින්තන ශක්තිය හා තර්කන ශක්තිය වර්ධනය වීමට බලපායි.

තේරවිලි නිර්මාණයට පාදක නොවූ ජීවී-අජීවී වස්තුවක් නොමැති තරමට ඒවායේ වස්තු විෂය පුළුල් පරාසයක පවතී. ප්‍රස්තුත වස්තුවක් උචිත ආකෘතියට ගැළපෙන පද සංයෝජනයෙන් අලංකෘතව මහත් අභිරුචියකින් ව්‍යවහාර කිරීමට හැම තේරවිල්ලකින් ම පාහේ ජනයා අතර අභිප්‍රේරණයක් ජනිත කර ඇත්තේ ඒවායේ නිර්මාණාත්මකභාවයත් ඊට බද්ධ වී තිබෙන ජන විඥ්ඥාණයත් නිසා බව නිගමනය කළ හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

සෝරත හිමි, වැලිවිටියේ. (1999). ශ්‍රී සුමංගල ශබ්දකෝෂය- ද්විතීය භාගය. ගොඩගේ.

ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය. (1982). *විධායක කර්තෘ: හරිශ්චන්ද්‍ර විජයතුංග. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.*

හේවගේ, බුද්ධදාස. (2014).*සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂය. පියුමි.*

සුමනවංශ හිමි, කපුගම. (1993). *ප්‍රහේලිකා විචාරය. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.*

ලොකුබණ්ඩාර වි.ජ.මු. (2000). *තේරවිලි කවි. සිංහල සාහිත්‍ය ලතා. සංස්. කොත්මලේ අමරවංශ හිමි.*

දිසානායක, ජේ. බී. (2010). *සිංහල තේරවිලි. සුමිත.*

සිංහල ජනකවි සංග්‍රහය. (2009). *අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.*

රත්නපාල, නන්දසේන. (2007). *ජනශ්‍රැති විද්‍යාව, ගොඩගේ.*

සිංහල මහාවංශය, (2004). *බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.*

උම්මග්ග ජාතකය. (2009). *අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.*

ලොකුහේවා, සඳරුවන්. (2020). *තේරවිලි සහ තුන් තේරවිලි, ගොඩගේ.*
මාදුවගේ, සිරිපාල. (2023). *සිංහල තේරවිලි. ගොඩගේ.*
හෙළමග විසිතුරු. (2003).*සංස්. පණ්ඩුල ඇඳගම. සර්වොදය විශ්වලේඛා.*
තිලකරත්න, මිනිවන්. පී. (1971). *ජනකවිය හා සිංහල සංස්කෘතිය. දීපානි.*
සෝරත හිමි, වැලිවිටියේ. (1963). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය- ප්‍රථමභාගය. ගොඩගේ.*
පීරිස්, රැල්ෆ්. (1978). *සිංහල සමාජ සංවිධානය. සමන්.*
ධම්මින්ද හිමි අඟුළුගහ සහ තවත් අය. (1982).*සිංහල ශබ්දකෝෂය-5 කාණ්ඩය. ගුණසේන.*
දනන්සූරිය, පීනදාස. (1996). *කවිකාරමඩුව සහ එහි නියුතු කවීන්ගෙන් සාහිත්‍ය කලාදියට සැපයුණු දායකත්වය, හඬ, සංස්. තිඹිරියාගම බණ්ඩාර, මහින්ද කුමාර දලුපොත, යසනාත් ධම්මික බණ්ඩාර. ඇතුගල්පුර මාධ්‍ය විමර්ශන කවය.*
අලුත්ගේ, කිත්සිරි. (1998). *සිංහල තේරවිලි, ගුණසේන.*
බණ්ඩා, ස.ජ.සුමනසේකර. (2002). *පහළ ඌවේ ජනකවි. ගොඩගේ.*
මානෑව, කේ.බී. (2014). *මහතලා ජනවහර. ගොඩගේ.*
සිංහල ජනකවි සංග්‍රහය. (2009). *අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.*
විමලවංශ හිමි, බද්දේගම. (1964). *අපේ සංස්කෘතිය. ගුණසේන.*
ධම්මානන්ද හිමි, තෙරිපැහැ. (1986). *දහම්ගැට මාලය. සිංහල මාල කවි සංග්‍රහය. ශ්‍රී ලංකා ජාතික යුනෙස්කෝ ජාතික මණ්ඩලය.*
Islam, Mazharul. (1985). *Folklore:The Pulse of the People,Concept Publishing House. New Delhi.*
Wijesekara, Nandadeva. (1990). *The Sinhalese. Gunasena.*
The Britannica Dictionary. (2024). *Retrieved 28.09.2024 from https://www.britannica.com/dictionary/lore.*
Merriam-Webster. (2024). Folklore, *Retrieved October 21, 2020, from https://www.merriam-webster.com/dictionary/folklore*